ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# අදියර I විභාගය - 2022 ජුලි

## යෝජිත උත්තර

## (103) ආර්ථික විද්‍යාව (ECN)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර I විභාගය - 2022 ජුලි

# (103) ආර්ථික විද්‍යාව

# යෝජිත උත්තර

(මුළු ලකුණු 40) **A කොටස**

*පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

| | |
|---|---|
| **1.1** | (4) |
| **1.2** | (1) |
| **1.3** | (1) |
| **1.4** | (2) |
| **1.5** | (2) |
| **1.6** | (2) |
| **1.7** | (3) |
| **1.8** | (3) |
| **1.9** | (4) |
| **1.10** | (4) |

aat SRI LANKA

**1.11** සැලසුම්ගත

**1.12** ආන්තික නිෂ්පාදනය

**1.13** අසත්‍ය

**1.14** සත්‍ය

**1.15 නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනයේ ලක්ෂණ**

1) මිනිසා විසින් නිර්මාණය කරන ලද නිෂ්පාදන සාධකයක් වීම
2) ප්‍රාග්ධනයේ මූර්ත සංකල්පයක් වීම
3) නැවත නැවතත් නිෂ්පාදනයට යොදා ගත හැකි වීම
4) භාවිතයත් සමග ක්ෂය වීම
5) ප්‍රාග්ධනය ඵලදායීතාවයකින් යුක්ත වීම
6) ප්‍රාග්ධනය සඳහා කරන ලද ගෙවීම පොලී ලෙස හැඳින්වේ

**1.16 හිඟ අයවැය**

හිඟ අයවැයක් යනු රාජ්‍ය වියදම රාජ්‍ය ආදායමට වඩා වැඩි වීමයි.

උදාහරණය: **අයවැය හිඟය = රජයේ ආදායම - රජයේ වියදම්**

= රුපියල් මිලියන 400 - රුපියල් මිලියන 470

= (රු. මිලියන 70)

**1.17 රජය විසින් මිල පාලනයක් පැනවීමට හේතු**

1) වෙළඳපොලේ පවතින භාණ්ඩයේ හෝ සේවාවේ මිල පාරිභෝගිකයාට දැරිය හැකි නොවීම.

2) වෙළඳපොලේ භාණ්ඩ හිඟයක් පවතින අවස්ථාවක අසාධාරණ මිල ඉහළ යාම වැළැක්වීමට.

3) ඉහළ උද්ධමන තත්ත්වයන් පාලනය කිරීමට.

4) භාණ්ඩ හෝ සේවා සැපයුම සඳහා නිෂ්පාදකයින්ට සාධාරණ සහ ප්‍රමාණවත් ආදායමක් ලැබෙන බව සහතික කිරීමට (නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමට).

**1.18 මුදලට ඇති ඉල්ලුම තීරණය වන ප්‍රධාන හේතු**

1 ගනුදෙනු චේතනාව

2 ආරක්ෂණ චේතනාව

3 සමපේක්ෂණ චේතනාව

**1.19 මුළු නිෂ්පාදිතය (TP) සහ සාමාන්‍ය නිෂ්පාදනය (AP) අතර වෙනස**

**මුළු නිෂ්පාදිතය (TP)** - විචල්‍ය යෙදවුම් ස්ථාවර යෙදවුම් සමග මිශ්‍ර කරමින් නිෂ්පාදනය සිදු කිරීමෙන් ලබන ප්‍රතිඵලය මුළු නිෂ්පාදිතයයි.

**සාමාන්‍ය නිෂ්පාදිතය (AP)** - විචල්‍ය යෙදවුම් ඒකකයකට සාමාන්‍යයෙන් ලැබෙන නිමවුම් ඒකක ප්‍රමාණය සාමාන්‍ය නිෂ්පාදිතය නම් වේ. මුළු නිෂ්පාදිතය විචල්‍ය යෙදවුමෙන් බෙදීමෙන් සාමාන්‍ය නිෂ්පාදිතය ලබා ගත හැකිය.

$$\text{සාමාන්‍ය නිෂ්පාදනය} = \frac{\text{මුළු නිෂ්පාදිතය}}{\text{විචල්‍ය යෙදවුම්}}$$

**1.20 මානව සංවර්ධන පැතිකඩයන් ඇතුළත් අයිතම**

1) ආදායම

2) අධ්‍යාපනය

3) සෞඛ්‍ය තත්ත්වය

4) දේශපාලන ස්වාධීන බව

5) යහපත් සමාජ සම්බන්ධතා

6) සවිබල ගැන්වීම

7) සමානාත්මතාවය

***(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)***

***A කොටසෙහි අවසානය***

*(මුළු ලකුණු 40 යි)*

**B කොටස**

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

***පරිච්ඡේදය 01 - ව්‍යාපාර පරිසරයට අදාළ ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති***

**(a)**

ආවස්ථික පිරිවැය යනු සම්පත් හිඟකම නිසාත් ඒවායේ විකල්ප භාවිතය පවතින නිසාත් විකල්ප අතුරින් එක් විකල්ප අවස්ථාවක් තෝරා ගැනීම නිසා කැප කිරීමට සිදු වන ඊළඟ හොඳම විකල්ප අවස්ථාවේ වටිනාකමයි. ආවස්ථික පිරිවැය යනු තීරණ ගැනීමේදී මුල්‍ය වටිනාකම ඇතුළත් විය හැකි හෝ නොවිය හැකි සැබෑ සංකල්පයකි. ආර්ථික විද්‍යාවේ තීරණ ගැනීමේදී සලකා බලන ප්‍රධාන පිරිවැය එයයි.

***උදාහරණය 1:*** අමල් ඔහුගේ පුද්ගලික ඉතුරුම් වලින් එක් ස්ථාවර තැන්පතුවකින් ලබාගත් රු. 100,000/- යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කළ අතර එම ව්‍යාපාරය ආරම්භ කිරීම හේතුවෙන් අමල්ගේ ආවස්ථික පිරිවැය වනුයේ ඔහුට උපයා ගත හැකිව තිබූ ආයෝජනය කළ ප්‍රාග්ධනයේ පොලියයි.

***උදාහරණ 2:*** ශිෂ්‍යයෙකු ඔහු සතුව ඇති රු. 2,500/- න් තම උපකාරක ගාස්තුව පියවීමට තීරණය කර ඇති අතර මේ නිසා ඔහුට අත්හැරිය යුතු මීළඟ හොඳම විකල්පය වූයේ චිත්‍රපට ටිකට් පතක් මිලදී ගැනීම නම්, මෙම ශිෂ්‍යයාගේ උපකාරක ගාස්තුව පියවීමට ඇති ආවස්ථික පිරිවැය වනුයේ චිත්‍රපට ටිකට් පතක් මිලදී ගැනීමයි.

***(ලකුණු 03)***

**(b)**

**නිෂ්පාදනය කළ යුත්තේ කුමක්ද සහ කොපමණද?**

පෞද්ගලික අංශය වැඩි මිලක් නියම කරන සහ ඉහළ ලාභයක් ලබා දෙන භාණ්ඩ නිෂ්පාදනය කිරීමට නැඹුරු වේ. රාජ්‍ය අංශය සමාජ සුබසාධනය වැඩි කිරීමේ චේතනාවෙන් භාණ්ඩ නිෂ්පාදනය කරයි. රජය බදු සහ සහනාධාර හරහා මිලට බලපෑම් කරන අතර එය මිල යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වයට සෘජුව හා වක්‍රව බලපෑනු ලබයි.

SRI LANKA

**කෙසේ නිපදවන්නේද?**

පෞද්ගලික අංශය වඩා ලාභදායී හා අඩු පිරිවැයකින් යුතු නිෂ්පාදන ශිල්ප ක්‍රම භාවිත කරයි. රජයේ නිෂ්පාදන ශිල්පීය ක්‍රම තෝරා ගැනීම පදනම් වී ඇත්තේ සමාජයේ සමාජ සුබසාධනය සහ සාධාරණත්වය උපරිම කිරීම මත ය.

**කා සඳහා නිපදවන්නේද?**

මිශ්‍ර ආර්ථිකය මෙම ගැටලුව සඳහා විසඳුම් සොයනුයේ මහජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව මත වන අතර එයට රජයෙන් බලපෑම් එල්ල වේ. (මිශ්‍ර ආර්ථික ක්‍රමය යටතේ රාජ්‍ය/ආණ්ඩුව බදු, සහනාධාර හරහා මිනිසුන්ගේ මිලදී ගැනීමේ හැකියාවට බලපෑම් කරයි. එසේම මහජනතාවගේ ක්‍රය ශක්තිය, මානව සහ දේපළ සම්පත්වල හිමිකාරිත්වය මත රඳා පවතී. රජය විසින් මහජනතාවගේ ක්‍රය ශක්තිය වෙනස් කිරීමට මැදිහත් වන ආකාරය පිළිබඳ උදාහරණ පහත පරිදි සඳහන් කළ හැකිය;

උදා - ආදායම් සහ ධනය මත අනුක්‍රම බදු පැනවීම මගින්, අඩු ආදායම්ලාභී අය සඳහා සහනාධාර ලබාදීම මගින්, සමාජ සංරක්ෂණ ක්‍රම ඇති කිරීමෙන්.

***(ලකුණු 04)***

| පරිච්ඡේදය 03 – නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම හා විවිධ වෙළෙඳපොළ ව්‍යුහයන් |
|---|

**(c) ඒකාධිකාරී වෙළෙඳපොළක ලක්ෂණ**

1) ප්‍රවේශයට බාධා පැවතීම

2) නිෂ්පාදනය සුවිශේෂී වීම / සමීප ආදේශක නොමැති වීම

3) එක් ආයතනයක් පමණක් නිෂ්පාදනයේ නිරත වීම

4) වෙළෙඳපොළ තොරතුරු අපූර්ණ වීම හා තොරතුරු පිරිවැයකින් තොරව ලබා ගැනීමට නොහැකි වීම

5) මිල සාදන්නෙක් වීම

6) ලාභය උපරිම කිරීම

7) ආර්ථික පිරිමැසුම් ඇති වීම

8) මිල වෙනස් කිරීම

*(ලකුණු 03)*
*(මුළු ලකුණු 10)*

## *තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː*

| පරිච්ඡේදය 02 - ඉල්ලුම, සැපයුම, හා සමතුලිතය හා රජය මැදිහත් වන ආකාරය |
|---|

**(a)**

**(i)** Qd = 1600 – 5P

Qs = -800 + 3P

**සමතුලිතයේදි ; Qd = Qs**

1600 – 5p = -800 + 3P

1600 + 800 = 5P + 3P

2400 = 8P

**300 = P**

*Qd සමීකරණයට ආදේශනය*

Qd = 1,600 – 5P

= 1,600 – (5×300)

= 1,600 – 1500

= **100 (ඒකක)**

හෝ

*Qs සමීකරණයට ආදේශනය*

Qs = -800 + 3P

= -800 + (3×300)

= -800 + 900

= **100 (ඒකක)**

**සමතුලිත මිල – රු. 300/-**
**සමතුලිත ප්‍රමාණය – ඒකක 100 කි**

*(ලකුණු 04)*

**(ii) පාරිභෝගිකයාගේ අතිරික්තය**

**පාරිභෝගිකයාගේ අතිරික්තය = (උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල) × සමතුලිත ප්‍රමාණය / 2**

= (320 - 300) × 100 / 2

= රු. **1000/-**

**පෙර වැඩ - වෙළඳපොලේ භාණ්ඩ අලෙවි කරන උපරිම මිල සොයා ගැනීම**

$Qd = 1,600 – 5P$ ⟶ "0" වෙනුවට "Qd" ආදේශනය

$0 = 1,600 – 5P$

$5P = 1,600$

$\underline{P = 320}$

*(ලකුණු 02)*

**(b)**

අවම මිලක් පැනවීමේ පරමාර්ථය වන්නේ නිෂ්පාදකයින් ආරක්ෂා වන ආකාරයෙන් සාධාරණ මිලක් නියම කර නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමයි. අවම මිලක් පැනවූ විට වෙළෙඳපොලේ අතිරික්ත සැපයුමක් නිර්මාණය වේ. මෙය ආර්ථිකයේ හිග සම්පත් වෙන් කිරීම / බෙදාහැරීමේ අකාර්යක්ෂමතාවයන් ඇති කිරීම මගින් වෙළෙඳපොල තුළ අසමතුලිතතාවයක් ඇති කරයි. එබැවින් වෙළෙඳපොලේ අතිරික්ත සැපයුම ඉවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම වැදගත් වේ. උදාහරණයක් ලෙස රජයට පහත ක්‍රියාමාර්ග ගත හැක;

- අතිරික්ත සැපයුම මිලදී ගෙන අනාගත භාවිතය සඳහා ගබඩා කිරීම
- අතිරික්ත සැපයුම අපනයනය කිරීමට නිෂ්පාදකයින්ට උපදෙස් සහ සහාය ලබා දීම
- අතිරික්ත සැපයුම භාවිතයෙන් ආදේශක නිෂ්පාදන නිෂ්පාදනය කිරීමට නිෂ්පාදකයින් දිරිමත් කිරීම.




*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10 යි)*

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 05 - මූල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම්***

### (a) ඉල්ලුම ඇදුණු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය අතර වෙනස

යම් කාල සීමාවක් තුළ සමාහාර සැපයුමට සාපේක්ෂව සමාහාර ඉල්ලුම වැඩි වීම නිසා භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම ඉහළ යාම ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය න්‍යාය තුළින් අදහස් වේ. මුදල් සැපයුම වැඩිවීම, පෞද්ගලික හා රාජ්‍ය වියදම් වැඩිවීම, ආර්ථිකයක අපනයන ආදායම වැඩිවීම යනාදිය නිසා ඉල්ලුම ඇදුණු උද්ධමනය ඇතිවේ.

ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සිදුවන්නේ භාණ්ඩ හා සේවා සඳහා වන සමාහාර ඉල්ලුම සමාහාර සැපයුම ඉක්මවා ගිය විටය. මේ ආකාරයේ උද්ධමනය සිදුවන්නේ සමස්ත ඉල්ලුමේ අධික වර්ධනයක් ඇති වූ විට සහ උද්ධමන පරතරයක් පවතින විටය.




**පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය** සිදුවන්නේ සමාගම් තම නිෂ්පාදන පිරිවැය ඉහළ යාමෙන් පසු ලාභ ආන්තිකය පවත්වා ගැනීමට හෝ ආරක්ෂා කිරීමට මිල වැඩි කරන විට වන අතර එය සාමාන්‍යයෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාමේ ප්‍රතිඵලයකි. පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය සැපයුම් පාර්ශ්වයෙන් ආරම්භ වන අතර, එය නිෂ්පාදන පිරිවැය ඉහළ යාම තුළින් දී ඇති කාල සීමාව තුළ සමාහාර සැපයුම අඩුවීම හේතුවෙන් ආර්ථිකයේ මිල මට්ටමේ ඉහළ යාමකි.

පිරිවැයෙන් තල්ලු වු උද්ධමනය සඳහා හේතු කිහිපයක් නම්,

- ආර්ථිකයේ වැටුප් අනුපාතය ඉහළ යාම
- ආර්ථිකයේ පොලී අනුපාතය ඉහළ යාම
- අමුද්‍රව්‍ය මිල සහ අනෙකුත් යෙදවුම් මිල ඉහළ යාම
- ආනයන මිල ඉහළ යාම




*(ලකුණු 04)*

**(b) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තියේ ගුණාත්මක පාලනයන්**

1) ණය සඳහා උපරිම කල්පිරීමේ කාල සීමාවක් සැකසීම
2) වරණාත්මක පොලී අනුපාතිකයන් නියම කිරීම
3) ණය ඇපකර සඳහා සීමාවන් සැකසීම
4) ආයෝජන සහ ණය සඳහා සීමාවන් සැකසීම
5) ණයවර ලිපි කාසි ආන්තික නියම කිරීම
6) වක්‍ර පාලනය
7) ඍජු පාලනය වෙනුවට ඔවුන්ගේ සහයෝගීතාවය ලබා ගැනීමෙන් වාණිජ බැංකුවලින් ණය ගලායාම පාලනය කිරීම

*(ලකුණු 02)*

**(c) ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදීම / අඩු කිරීම සඳහා මුද්‍රා ප්‍රතිපත්තිය බලපානු ලබන ආකාරය**

මූල්‍ය ප්‍රතිපත්තිය යනු ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය ප්‍රතිපත්තියේ ස්ථායීතාව යන අරමුණු වෙත ළඟා වීමට පොලී අනුපිතිකය හා මුදල් සැපයුම කෙරෙහි බලපෑම් කිරීමට මූල්‍ය උපකරණ හැසිරවීමේ ක්‍රියාවලියයි. ආර්ථිකයේ මුදල් සැපයුම සහ ආර්ථිකයේ පොලී අනුපාතිකය පාලනය කිරීම සඳහා ආර්ථිකයක මහ බැංකුව හෝ මූල්‍ය බලධාරීන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග එයට ඇතුළත් වේ.

සාර්ව ආර්ථික ස්ථායීතාව සහ දේශීය මිල පිළිබඳ විශ්වාසය තබා ගැනීම සඳහා ස්ථාවර මූල්‍ය ප්‍රතිපත්තියක් වැදගත් වේ. ආර්ථික විද්‍යාඥයන් විසින් මූල්‍ය ප්‍රතිපත්තිය සලකන්නේ ආර්ථික මන්දගාමිත්වයට/අර්බුදවලට එරෙහිව ආරක්ෂා කිරීමේ පළමු මාර්ගය ලෙස ය.

මූල්‍ය ප්‍රතිපත්තිය වෙනස් කිරීම සමාහාර ඉල්ලුම කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කරන අතර එමඟින් නිෂ්පාදනය සහ මිල යන දෙකටම එය බලපානු ලබයි. ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සැබෑ ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වන ක්‍රම ගණනාවක් තිබේ.

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය ජයගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ භාවිත කරමින් මූල්‍ය ප්‍රතිපත්තිය හරහා බලපෑම් කළ හැකිය. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක උපකරණ හරහා වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට පියවර ගත හැකිය.

➢ <u>ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ</u>

**1) මහ බැංකු පොළී අනුපාතිකය**

මහ බැංකුව විසින් අවසාන ණය දෙන්නා වශයෙන් ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී සිටින වාණිජ බැංකු වෙතින් අය කරනු ලබන පොළී අනුපාතය මහ බැංකු පොළී අනුපාතයයි. බැංකු පොළී අනුපාතිකයේ වෙනස්කම් හරහා, වාණිජ බැංකුවල ණය මැවීමේ හැකියාවට මහ බැංකුවට බලපෑම් කළ හැකි ය.

නිදසුනක් වශයෙන්, මහ බැංකුව බැංකු පොළී අනුපාතිකය ඉහළ දැමූ විට වාණිජ බැංකුහට මහ බැංකුවෙන් ණය ලබා ගැනීමේ පිරිවැය ඉහළ යනු ඇත. මෙමගින් වාණිජ බැංකු මහ බැංකුවෙන් ණය ගැනීම අධෛර්යමත් කරනු ඇත. තවද, බැංකු පොළී අනුපාතිකය ඉහළ දැමූ විට වාණිජ බැංකුව ද ඔවුන්ගේ ණය පොලී අනුපාත ඉහළ නංවයි. ණය අනුපාත එනම් වාණිජ බැංකු විසින් අය කරන පොලී අනුපාත වැඩි වන විට. ව්‍යාපාරිකයන්, කර්මාන්තකරුවන් සහ විභව ආයෝජකයින් වාණිජ බැංකුවලින් වැඩිපුර ණය ගැනීම අධෛර්යමත් වනු ඇත. මෙය නිසා ණය ගැනීම් සීමා වී ආර්ථිකයේ මුදල් සැපයුම සංකෝචනය වනු ඇත. එබැවින් ශ්‍රී ලංකාව දැන් මුහුණ දී සිටින ප්‍රධාන ආර්ථික ගැටලුව වන "උද්ධමනය" එමගින් අඩු කළ හැකිය.

**2) විවට වෙළෙඳපොළ කටයුතු**

විවට වෙළෙඳපොළ කටයුතු ණය පාලනයේ තවත් වැදගත් උපකරණයකි. විවට වෙළෙඳපොළ කටයුතු යන යෙදුමෙන් අදහස් වන්නේ විවෘත වෙළෙඳපොලේ අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට හෝ එන්නත් කිරීමට මහ බැංකුව විසින් සුරැකුම්පත් මිලදී ගැනීම සහ විකිණීමයි.

මහ බැංකුව විසින් සුරැකුම්පත් විකිණීම ණය සැපයීමේ හැකියාව අඩු කිරීමට හේතු වේ. මහ බැංකුව විවෘත වෙළෙඳපොළේ සුරැකුම්පත් අලෙවි කරන විට වාණිජ බැංකුවවල සංචිත අඩු වී ණය සැපයීමේ හැකියාව අඩු වීමක් සිදු වේ. එනම් මුදල් සැපයුම සංකෝචනය වේ.

**3) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය**

aat SRI LANKA

මහ බැංකුවේ නියමයන්ට අනුකූලව වාණිජ බැංකු විසින් තම තැන්පත් ප්‍රමාණයෙන් යම් ප්‍රතිශතයක් අතැති මුදල් හා බැංකු මුදල් ලෙස ළඟ තබා ගැනීම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ලෙස හඳුන්වයි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ යාම මුදල් සැපයුම සංකෝචනය කරයි. රට තුළ පවතින උද්ධමනය අඩු කිරීමට ද මෙය ඉවහල් වනු ඇත.

➢ <u>ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ</u>

1) ණය සඳහා උපරිම කල්පිරීමේ කාල සීමාවක් සැකසීම

2) වරණාත්මක පොලී අනුපාතිකයන් නියම කිරීම

3) ණය ඇපකර සඳහා සීමාවන් සැකසීම

4) ආයෝජන සහ ණය සඳහා සීමාවන් සැකසීම

5) ණයවර ලිපි කාසි ආන්තික නියම කිරීම

6) වක්‍ර පාලනය

7) ඍජු පාලනය වෙනුවට ඔවුන්ගේ සහයෝගීතාවය ලබා ගැනීමෙන් වාණිජ බැංකුවලින් ණය ගලායාම පාලනය කිරීම

*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10)*

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

*පරිච්ඡේදය 06 - අන්තර්ජාතික වෙළෙඳාම සහ විදේශ විනිමය වෙළෙඳපොළ*

**(a)**

| | *ආවස්ථික පිරිවැය - සහල්* | *ආවස්ථික පිරිවැය - තිරිඟු* |
|---|---|---|
| **X** | 3/6 = 0.5 | 6/3 = 2 |
| **Y** | 4/2 = 2 | 2/4 = 0.5 |

X රටට සහල් නිෂ්පාදනයේ දී සාපෙක්ෂ වාසිය ඇති අතර, තිරිඟු නිෂ්පාදනයේ දී Y රටට සාපෙක්ෂ වාසිය ඇත.

*(ලකුණු 04)*

**(b) එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල මෑතකදී අවප්‍රමාණය වීමට හේතු**

1) **දිගු කාලයක් විනිමය අනුපාතිකය කෘතිමව තබා ගැනීම**

විනිමය අනුපාතිකයේ ඉල්ලුම සහ සැපයුම සැලකිල්ලට නොගෙන විනිමය අනුපාතිකය ස්ථාවර කර හදිසියේ එය පා කිරීමේ ප්‍රතිඵලය වූයේ ඩොලරයේ අගය ඉහළ යාමයි.

2) **ආනයන වියදම් සහ අපනයන ආදායම අතර පරතරය**

ශ්‍රී ලංකාවේ ආනයන වියදම අපනයන ආදායම ඉක්මවා යයි. එය වෙළෙඳ ගිණුමේ හිඟ ශේෂයක් ඇති කරයි.

3) උද්ධමනයට වඩා අඩු පොලී අනුපාත පවත්වා ගැනීම, ඉතිරි කිරීම වෙනුවට පරිභෝජනය කිරීමට මිනිසුන්ව එමගින් පොළඹවනු ලබයි.

4) ගෙවුම් ශේෂයේ පරතරය මූල්‍යකරණය සඳහා විදේශ ණය මත දැඩි ලෙස යැපීම.

5) ව්‍යාපෘති සඳහා ලබා ගත් විදේශ ණය වෙළඳ ගිණුමේ හිඟය පියවීම සඳහා භාවිත කර ඇති අතර ණය සඳහා පොලිය ගෙවීමට විදේශ සංචිත යොදා ගෙන ඇත.

6) කොවිඩ්-19 සමඟ, ශ්‍රමිකයන්ගෙන් විදේශ ප්‍රේෂණ අඩු වී ඇත. එය රටේ විදේශ විනිමය සැපයුම අඩුවීමට හේතු විය.

7) අමුද්‍රව්‍ය හිඟය හේතුවෙන් ගෝලීය ආර්ථිකයේ තෙල් හා ගෑස් මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ඇමෙරිකානු ඩොලර්යට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය විය.

8) කොවිඩ් -19 වසංගතය හේතුවෙන් සංචාරකයින් පැමිණීම විශාල ලෙස පහත වැටුනු අතර ඒ හේතුවෙන් රටට උපයා ගත හැකිව තිබූ විදේශ ආදායම අහිමි වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලර්යට සාපේක්ෂව අවප්‍රමාණය වී ඇත.

9) අපනයන වර්ධනය අඩු වීමඃ අපනයන ආදායම අඩු වූ විට විදේශ මුදල් සැපයුම අඩු වී මුදල් අවප්‍රමාණය විය.

10) රටෙන් විදේශ ආයෝජන ඉවත් කර ගැනීම සහ රටට ආයෝජන ගලා ඒම අඩු වීම.

11) දේශපාලන හා ආර්ථික හේතු නිසා විදේශ ආයෝජකයින් විශාල ප්‍රමාණයක් රට හැර ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස දේශිය මුදල් ඒකකය අවප්‍රමාණය වී ඇත.

*(ලකුණු 04)*

**(c) ජාත්‍යන්තර වෙළෙඳාමේ වාසි**

1) ආර්ථික වර්ධනය වේගවත් කිරීම.

2) ජාත්‍යන්තර ආර්ථික සහයෝගීතාවයේ වර්ධනය වීම.

3) අතිරික්ත නිෂ්පාදනය විකිණීම සඳහා වෙළෙඳපොළක් සොයා ගැනීමේ හැකියාව ඇති වීම.

4) දේශීයව නිෂ්පාදනය කළ නොහැකි භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව.

5) විදේශ ණය, විදේශ ප්‍රදාන සහ විදේශ ආයෝජන රටට ගලා ඒම.

6) පරිභෝජනය සඳහා විවිධ භාණ්ඩ පැවතීම මෙන්ම නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයෙන් පිටත පිහිටා ඇති භාණ්ඩවල සංයෝජනයක් පරිභෝජනය කිරීමට මිනිසුන්ට වීම.

7) රටවල් සාපෙක්ෂව වාසි ඇති භාණ්ඩ නිෂ්පාදනය කිරීමට නැඹුරු වන බැවින් සම්පත් කාර්යක්ෂමව වෙන් කිරීම සහ වඩා හොඳින් භාවිත කිරීම.

8) තරගකාරීව සිටීම සඳහා පිරිවැය අඩු කර ගැනීම සඳහා වඩා හොඳ නිෂ්පාදන ක්‍රමයක් අනුගමනය කිරීමට රටවල් උත්සාහ කරන බැවින් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව වර්ධනය වීම.

9) වෙළෙඳාම හරහා රටවල භාණ්ඩ සඳහා වෙළෙඳපොළ පුළුල් වන බැවින් ප්‍රවාහනය, බැංකුකරණය, රක්ෂණය යනාදී ක්ෂේත්‍රවල වැඩි රැකියා උත්පාදනය කළ හැකිය. මෙම තත්ත්වය ආදායම් උත්පාදනය ඉහළ නැංවීමට හේතු වනු ඇත.

10) තාක්ෂණය සහ දැනුම හුවමාරු වීම.

11) ජාත්‍යන්තර සංවිධානවල මගින් වෙළෙඳාම පෝෂණය කිරීම මගින් දේශපාලන, සමාජීය සහ සංස්කෘතික වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ආර්ථික නොවන වාසි ලබා ගත හැකි වීම.

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 10)*

aat SRI LANKA

***B කොටසෙහි අවසානය***

*(මුළු ලකුණු 20 යි)* **C කොටස**

***හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

***පරිච්ඡේදය 04 - ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය***

**(A)**

**(a)**

| | | රු. මිලියන |
|---|---|---|
| **(i) මූලික මිල මත දළ එකතු කළ අගය (GVA)** | | |
| සේවක ආදායම | | 1,000 |
| දළ මෙහෙයුම් අතිරික්තය | | 1,400 |
| මිශ්‍ර ආදායම | | 1,200 |
| නිෂ්පාදන සහනාධාර අඩු කළ පසු වෙනත් බදු | | 750 |
| **මූලික මිල මත දළ එකතු කළ අගය** | | **4,350** |

*(ලකුණු 05)*

| | | |
|---|---|---|
| **(ii) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය (GDP)** | | |
| මූලික මිල මත දළ එකතු කළ අගය (GVA) | | 4,350 |
| නිෂ්පාදන සහ ආනයන මත ශුද්ධ බදු | | 500 |
| **වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය (GDP)** | | **4,850** |

*(ලකුණු 02)*

| | | |
|---|---|---|
| **(iii) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම (GNI)** | | |
| වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය (GDP) | | 4,850 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික සංක්‍රාම | | |
| විදේශිය ප්‍රාථමික ආදායම් ලැබීම් | 1,200 | |
| විදේශිය ප්‍රාථමික ආදායම් ගෙවීම් | (1,500) | (300) |
| **වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම (GNI)** | | **4,550** |

*(ලකුණු 03)*

**(b) දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවන ඵලදායි ආර්ථික ක්‍රියාකාරකම්**

1) ඉගෙනීම සහ විවේකය

2) නොමිලේ ලබා ගන්නා ස්වභාවික සම්පත් (ඉඩම්, ජලය, වාතය)

3) නොගෙවූ ගෘහස්ථ සේවා

4) මිනිස් උත්සාහයකින් තොරව වර්ධනය වන ස්වභාවික සම්පත් (වනාන්තර)

5) මිල වෙනස්වීම් හෝ ස්වභාවික වර්ධනය හේතුවෙන් සම්පත්වල වටිනාකම වෙනස් වීම

*(ලකුණු 03)*

SRI LANKA

**(B) සාර්ව ආර්ථික අරමුණු (Macro-Economic Objectives) ලෙස සාධාරණ ආදායම් බෙදීයාම සහ පූර්ණ සේවා නියුක්තිය අතර වෙනස**

**<u>සාධාරණ ආදායම් බෙදීයාම</u>**

රටක ජනගහනය අතර සාධාරණව ආදායම් බෙදීයාම සහතික කිරීම මගින් එම රටට සමානාත්මතාවය ළඟා කර ගැනීමට හැකි වේ. රටක සෑම පුරවැසියෙකුටම ඔහුගේ/ඇයගේ අවශ්‍යතා සහ අවශ්‍යතා සපුරාලීමට හැකියාව ඇති බව සහතික වන ආකාරයෙන් ආදායම සහ ධනය බෙදී යා යුතු ය.

**<u>පූර්ණ සේවා නියුක්තිය</u>**

ආර්ථිකයේ ඇති සියලුම සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කළ විට ආර්ථිකයක් පූර්ණ සේවා නියුක්ති මට්ටමක් අත්කර ගනී. පූර්ණ සේවා නියුක්ති මට්ටමක් ළඟා කර ගැනීම ඉලක්ක කර ගැනීමේදී රැකියා අවස්ථා වැඩි කිරීම මගින් ශ්‍රම විරැකියාව අවම කිරීම අවශ්‍ය වේ.

***(ලකුණු 04)***

***පරිච්ඡේදය 07 - ආර්ථික වර්ධනය, සංවර්ධනය හා ආර්ථිකයේ නව ප්‍රවණතා***

**(C) ආර්ථික වර්ධනයේ නිර්ණායක**

1) සම්පත් සම්භාරය
- භෞතික ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- ස්වභාවික ප්‍රාග්ධනය
- සමාජ ප්‍රාග්ධනය

2) ඵලදායිතාව
- තාක්ෂණය
- නව්‍යතා බිහිවීම
- පර්යේෂණ සහ සංවර්ධන සඳහා ආයෝජනය

3) ආර්ථික ස්ථායීතාවය
4) දේශපාලන ස්ථාවරත්වය
5) යහපාලනය
6) දිරිගැන්වීම්
7) දූරදර්ශී නායකත්වය

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 20)***

***C කොටසෙහි අවසානය***

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*